


# ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත යොමු වීම:

## අභියෝග සහ අවස්ථා

### 1. හැඳින්වීම - ශ්‍රී ලංකාව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අතර සම්බන්ධතාවන් හි සංක්ෂිප්ත පසුබිම

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වනාහි සිය සාමාජික රටවල විනිමය අනුපාතයන් සහ ගෙවුම් ශේෂයන් හි ඇති වන සංචලනයන් විෂයෙහි අවධානයෙන් යුතුව සිය සාර්ව ආර්ථික ප්‍රතිපත්තීන්ට අනුව ලෝක ආර්ථික ක්‍රමය මෙහෙයවීමෙහි යෙදී සිටින ප්‍රධාන ජාත්‍යන්තර සංවිධානයයි. එහි ප්‍රධාන කාර්යභාරය වන්නේ ගෙවුම් ශේෂ දුෂ්කරතාවන්ට මුහුණ දී සිටින රටවලට මූල්‍යමය සහායන් ලබදීමයි.

ශ්‍රී ලංකාව විදේශ විනිමය දුෂ්කරතාවන්ට මුහුණ දුන් ඉහත අවස්ථා ගණනාවක දී ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සහාය ලබාගෙන තිබේ. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ විධිමත් ගනුදෙනු ආරම්භ කෙළේ නිදහස් ආර්ථික ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැංවීම පිණිස එම සංවිධානය විසින් පෙර සූදානම් විධිවිධානයන් මෙරටට සකසා දෙනු ලැබූ 1970 මුල් භාගයේදී ය. 1977, 1979, 1980, 1981, 1982, 1983, 1988, 1989, 1991, 2001, 2003, සහ 2005 යන සෑම වර්ෂයකදී ම ශ්‍රී ලංකාවේ පැවැති රජයයන් විසින් එවැනි ණය පහසුකම් ලබාගෙන තිබේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ශ්‍රී ලංකාව මෑතක දී ම ලබාගත් පහසුකම පිළිබඳ කෙටි විස්තරයක් ප්‍රවර්තන ණය පහසුකමට පූර්විකාවක් වශයෙන් පහත දැක්වේ.

### 2001 හි පෙරසූදානම් විධිවිධානය

2001 වර්ෂයේ අප්‍රේල් මාසයේ දී මාස 1.3 ක ආනයනයන් පමණක් ආවරණය කරගත හැකි වන පරිදි මෙරට දළ නිල සංචිතයන් එ.ජ. ඩොලර් මිලියන 906 ක් දක්වා පහත වැටුණු අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීමත් විදේශ විනිමය සංචිත ගොඩනැංවීමත් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් එ.ජ. ඩොලර් මිලියන 274 ක් මෙරටට ලබා දෙන ලදී. 2002 ජූනි මාසය වන විට සම්පූර්ණ කළ යුතුව තුබුණු එයට අදාළ වැඩ පිළිවෙළ කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළට කොටි සංවිධානය විසින් පහර දීමත් 2001 ඔක්තෝබරයේ දී පාර්ලිමේන්තු මැතිවරණයක් ප්‍රකාශයට පත් කිරීම නිසා ඇති වූ දේශපාලන අවිනිශ්චිතතාවත් හේතු කොටගෙන පසුපසට තල්ලු වී ගියේ ය. මේ හේතුව නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් පනවන ලද කොන්දේසීන් නිසි වේලාවේ දී සපුරාලිය හැකි නොවී ය. අනතුරුව 2001 වර්ෂයේ දී පත් වූ නව රජය විසින් නැවත සාකච්ඡා කොට ක්‍රියාත්මක කරන ලද එම වැඩසටහන 2002 දී සම්පූර්ණ කරන ලදී.

### දරිද්‍රතා පිටුදැකීම් සහ සංවර්ධන ණය (PRGF) හා විස්තීරණ අරමුදල් ණය (EFF)

2003 දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව ඇතිකරගත් ගිවිසුම යටතේ එ.ජ. ඩොලර් මිලියන 567 ක් දක්වා වූ ණය පහසුකම් දෙකක් ලබා දීමට එකඟ විණි. එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ශ්‍රී ලංකාව වෙත කළ මුළු වෙන්කිරීම්වලට සමාන ය. මෙයින් එ.ජ. ඩොලර් මිලියන 369 ක් ලැබෙන්නේ දරිද්‍රතා පිටුදැකීම සඳහා වන අතර ඉතිරිය ඒ ඒ රටවල ගෙවුම් ශේෂ දුෂ්කරතා මඟහරවාලීම අරමුණු කොටගත් විස්තීරණ අරමුදල් ණය වශයෙන් ය. මෙම මුදල් අවුරුදු තුනක් මුළුල්ලේ කොටස් හතකින් ලබාගත හැකිව තිබේ. මෙමඟින් සහාය දීමට අපේක්ෂා කැරෙන්නේ කඩිනම් සංවර්ධනය සඳහා වූ දෘෂ්ටිමය ක්‍රමෝපාය වන 'ශ්‍රී ලංකාව යළි නැඟිටුවීම'යනුවෙන් හැඳින්වෙන දරිද්‍රතා අවම කිරීමේ ක්‍රමෝපාය පත්‍රිකාවෙහි ඇතුළත් රජයේ මධ්‍යම කාලීන වැඩපිළිවෙළට ය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මෙම තීරණය ආර්ථිකයේ ස්ථාවර භාවය යළි ඇති කිරීම සඳහා රජය ගෙන යන වැඩ පිළිවෙළ අනුමත කිරීමක් හා සමාන ය. කෙසේ වුව ද මුදාහරින ලද්දේ මෙම අරමුදලෙහි පළමු අදියරයන් පමණි. විශේෂයෙන් ම බදු අය කිරීමේ පිළිවෙත සහ රාජ්‍ය ආයතනයක් වූ මහජන බැංකුව ප්‍රතිව්‍යුහගත කිරීම වැනි ප්‍රධාන ව්‍යුහමය ප්‍රතිසංවිධානයන් හි ප්‍රගතියක් දක්නට නොමැති වීම හේතු කොටගෙන මෙම වැඩසටහනෙහි මූලික විමර්ශණයන් ප්‍රමාද කරන්නට සිදු වී ය. 2004 වර්ෂය අවසානයේ දී සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාවට නංවනු ලැබුව ද එම වර්ෂය තුළ දී දක්නට ලැබුණේ සාර්ව ආර්ථික කටයුතුවල බිඳ වැටීමකි. ඒ අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි දරිද්‍රතා පිටුදැකීමේ වැඩසටහන අවසානය දක්වා ක්‍රියාත්මක වන බවක් නොපෙනිණි.

### 2005 දී ස්වාභාවික විපත් (සුනාමි) සඳහා හදිසි ආධාර ලබා දීම

2004 දෙසැම්බර් මාසයේ දී සුනාමි ව්‍යසනයෙන් හානියට පත් ස්ථාන යළි ගොඩනැංවීම සඳහා අමතර ආනයනයන් අවශ්‍ය වීම ද සංචාරක ව්‍යාපාරයෙහි බිඳවැටීම ද හේතු කොටගෙන ශ්‍රී ලංකාවෙහි ගෙවුම් ශේෂය නැවතත් පහත වැටිණ. 2005 දී ඇති වූ නියඟය මෙන් ම තෙල් ප්‍රශ්නය ද ගෙවුම් ශේෂයේ වැටීම කෙරෙහි තවදුරටත් බල පෑවේ ය. මෙම තත්ත්වය යටතේ ශ්‍රී ලංකාව සතු විදේශ සංචිතයන් කෙරෙහි බලපෑමක් ඇති නොවන පරිදි රටෙහි හදිසි මූල්‍ය අවශ්‍යතා සපුරාගැනීම පිණිස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි හදිසි ආධාර ප්‍රතිපත්තිය යටතේ විශේෂ හිමිකම් ලබාගැනීමක් (SDR) වශයෙන් මිලියන 103. 35 ක් ( එනම් වෙන් කළ ප්‍රමාණයෙන් සියයට 25 ක් ) ඉල්ලා සිටීමට රජය පියවර ගත්තේ ය. PRGF සඳහා යෝග්‍යතා සහිත රටවල් වෙත ස්වාභාවික විපත් වෙනුවෙන් හදිසි ආධාර ලබා දීමේ සිය ප්‍රතිපත්තියට අනුව හදිසි ගෙවුම් ශේෂ මූල්‍ය අවශ්‍යතාවන් සපුරාලීමත් සාර්ව ආර්ථික ස්ථාවරත්වය යළි ඇති කරවීමත් පිණිස SDR මිලියන 103.4 ක් සියයට 0.5 ක වාර්ෂික පොලී අනුපාතයක් මත ලබා දීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් තීරණය කරන ලදී. හදිසි ආධාර අරමුදල් ලබා දීමේ දී මහආර්ථික ප්‍රතිපත්තීන් හි ඍජු බලපෑමක් ඇති නොවුව ද අලාභ ලබන ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමත් රාජ්‍ය මුදල් කළමනාකරණ වගකීම් පනතට අනුව බදු ප්‍රතිපත්තියෙහි අවශ්‍ය සංස්කරණයන් සිදු කිරීමත් රාජ්‍ය මුදල් ප්‍රතිපත්තියෙහි සංශෝධනයන් සිදු කිරීමත් විෂයෙහි රජය උනන්දු කරවීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි අධ්‍යක්ෂවරුන් විසින් මෙහි දී පියවර ගෙන තිබිණි.

## 2. ප්‍රවර්තන ණය පහසුකම-පෙර සූදානම් විධිවිධානය

දළ දේශීය නිශ්පාදිතයෙහි මනා වර්ධනයක් ද 2007 ජූලි මාසය වන විට මුදුනට ම නැග තුබුණු උද්ධමන අනුපාතයේ පහත වැටීමක් ද අපනයනයන් හි ඉහළ යාමක් ද ආයෝජනයන් හි ඉහළ යාමකට තුඩු දෙන ආකාරයේ ආගම්‍ය ප්‍රේෂණයන් හි වර්ධනයක් ද සහිතව ශ්‍රී ලංකාවෙහි ආර්ථීක පදනමෙහි දියුණුවක් 2008 තෙවැනි කාර්තුව වන තෙක් දක්නට ලැබිණි. එබැවින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි හෝ වෙනත් එවැනි ආයතනයක හෝ උපකාර මෙරටට අවශ්‍ය වූයේ නැත. එසේ වුව ද භාණ්ඩාගාර බිල්පත්වල හා බැඳුම්කරවල තුබුණු විදේශිය ආයෝජනයන් ආපසු ගැනීමත් බනිජතෙල් ආනයනයන් සඳහා පහසුවෙන් ලබා ගැනෙමින් තුබුණු කෙටිකාලීන ණය ක්ෂණිකව ආපසු ඉල්ලා සිටීමත් විදේශීය අරමුදල් යෙදවෙන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරවන්නන් සඳහා අවශ්‍ය වාණිජ මූල්‍ය පහසුකම් නොලැබී යාමත් එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ප්‍රධාන ජාත්‍යන්තර මුදල් වර්ගවල වටිනාකම ශීඝ්‍ර ලෙස පහත වැටීමත් හේතු කොටගෙන 2008 අවසාන කාර්තුවේ දී මෙරට විදේශීය සම්පත් බරපතල අර්බුදයකට මුහුණ පෑවේ ය. 2008 ජූලි මාසයේ දී එ.ජ. ඩොලර් 3.5 ක් ව තුබුණු විදේශ සංචිතයන් 2009 පෙබරවාරි වන විට එ.ජ. ඩොලර් 1.2 දක්වා පහත වැටිණ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ගෙවුම් ශේෂ දුෂ්කරතාවන් ගෙන් සහ වෙනත් සාර්ව ආර්ථීක අස්ථාවරත්වයන් ගෙන් මිදීම පිණිස 2009 මාර්තු මාසයේ දී එ.ජ. ඩොලර් 1.9 ක, එනම් මෙරට වෙනුවෙන් වෙන් කරනු ලැබ ඇති කොටස මෙන් සියයට 300 කට සමාන අතිරේක පෙර සූදානම් විධිවිධාන පහසුකමක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඉල්ලා සිටීමට ශ්‍රී ලංකාවට සිදු වී ය.

මේ සඳහා වූ අධ්‍යාශ ලිපිය **(Letter of intent)** ශ්‍රී ලංකා බලධාරීන් විසින් 2009 ජූලි 16 වැනි දින අත්සන් කරන ලද අතර 2009 ජූලි 24 වැනි දින ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලය විසින් පහසුකම අනුමත කරන ලදී. මෙහි ප්‍රධාන අරමුණු වූයේ විදේශීය සංචිතයන් තව දුරට ගොඩනැංවීමත් රාජ්‍ය මුදල් තත්ත්වය ශක්තිමත් කරවීමත් දේශීය මූල්‍ය වැඩපිළිවෙළ ශක්තිමත් කරවා එහි ස්ථාවරත්වය පවත්වාගෙන යාමත් එසේ ම ආරක්ෂක ජාලය සහ යළි පදිංචි කරවීමේ වැඩසටහන ශක්තිමත් කරවීමත් ය. මාස 20 ක කාලයක් තුළ දී සිය සංචිතයන් එ.ජ. ඩොලර් බිලියන 3.5ක් නැතහොත් මාස තුනහමාරක ආනයනයන්ට සමාන වටිනාකමක් ආසන්නයට නංවාගැනීම පිණිස ශ්‍රී ලංකාවට උපකාර කිරීමේ සැලසුම ද මෙහි අන්තර්ගත වී ය.

පහසුකමෙහි ප්‍රමාණය, අරමුදලෙන් මෙරටට වෙන් කරනු ලැබ තිබෙන ප්‍රමාණය මෙන් සියයට 400 කට සමාන වන්නා වූත් මෙතෙක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් මෙරටට ලැබී ඇති විශාලතම මුදල වූත් **SDR** බිලියන 1.65 ක් ( එ.ජ. ඩොලර් බිලියන 2.6 කට ආසන්න ප්‍රමාණයක් ) වන්නේ ය. **SDR** මිලියන 206.7 ක් ( එ.ජ. ඩොලර් මිලියන 322 කට ආසන්න ප්‍රමාණයක් ) වූ මෙහි පළමුවැනි අදියර වහා ම ලබා දීමට තීරණය විණි. ඉතිරිය ආර්ථීක කාර්ය සාධනය පිළිබඳව තෙමසකට වරක් කැරෙන විමර්ශනයන්ට යටත්ව මුදා හැරීමට අපේක්ෂිත වන අතර ඒ අනුව අවසාන අදියර 2011 මාර්තු මාසයේ දී මුදා හැරෙනු ඇත. 2012 අප්‍රේල් මාසයෙන් පටන් ගෙන අවුරුදු 4 ක් ඇතුළත දී මෙම ණය මුදල ආපසු ගෙවිය යුතු ය. **SDR** අනුපාතය අනුව ගණනය කැරෙන (ප්‍රවර්තන අනුපාතය වර්ෂයකට සියයට 0.3 කි.) සේවා ගාස්තුවක් ද ණය ශේෂයෙන් සියයට 1 ක් බැගින් ගණනය කැරෙන ස්ථාවර පොලියක් ද වශයෙන් වූ දෙවැදෑරුම් පිරිවැයක් මේ සඳහා දැරිය යුතු ය. මෙයට අමතරව ණය ශේෂය මෙරට වෙනුවෙන් වෙන් කරනු ලැබ තිබෙන ප්‍රමාණය මෙන් සියයට 300 ඉක්මවන්නේ නම් සියයට 2 ක් ද අවුරුදු 3 ක් ඉක්මවන කාලයක් එසේ පැවතියහොත් සියයට 3 ක් ද වශයෙන් වූ අධිභාරයක් ගෙවිය යුතු වන්නේ ය. මෙහි දෙවැනි විමර්ශනය 2009 සැප්තැම්බරයේ දී සිදු කරන ලදී.

පෙර සූදානම් විධිවිධානයෙහි ඉලක්කය වන්නේ ආයෝජක විශ්වාසය ඉහළ නැංවීම තුළින් රටෙහි ආර්ථීක වර්ධනයක් ඇති කරවීමත් එසේ ම දේශීය හා විදේශීය ආයෝජනයන් ආකර්ෂණය කරගැනීමෙහි ලා මෙරට පෞද්ගලික අංශයේ හැකියාවන් වර්ධනය කරවීමත් ඔස්සේ 2009 දී සියයට 7 ක් ව පැවැති අයවැය පරතරය 2010 වන විට සියයට 6 දක්වා ද 2011 වන විට සියයට 5 දක්වා ද පහත හෙළීමත් ය. යටිතල පහසුකම් සංවර්ධනය දෙසට මෙන් ම පශ්චාත්-ගැටුම් ප්‍රතිසංස්කරණයන් දෙසට ද යළි පදිංචි කරවීම් සහ සහන සැපයීමේ වැඩපිළිවෙල දෙසට ද මෙකී ආයෝජනයන් පහසුවෙන් යොමු කළ හැකි වන්නේ ය. අධ්‍යාශ ලිපියෙහිත් තාක්ෂණ අවබෝධතා ගිවිසුමෙහිත් සඳහන් වන ආකාරයට මෙහි අන්තර්ගත වන්නේ අභ්‍යන්තරව ස්වේච්ඡාවෙන් තෝරා ගැනුණු අනුදේශයන් ය.

## 3. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගන්නා ණය පහසුකම තුළින් මතු වන වාසිදායක අවස්ථා සහ අභියෝග

### වාසිදායක අවස්ථා

ආර්ථීක අභියෝගයන් තුළින් වුව ද ශ්‍රී ලංකාව ප්‍රවේශ වන්නට යන්නේ අපේක්ෂා තැබිය හැකි යුගයකට ය. විදේශීය සංචිතයන් යළි ගොඩ නංවාගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය විනය ඇති කරගැනීමේ ශක්තිය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගන්නා ණය මුදල තුළින් ශ්‍රී ලංකාවට අත් වන එක් ප්‍රධාන වාසියකි. විදේශීය අංශයන් වෙතින් පැනවෙන්නා වූ අනුදේශයන් ප්‍රතිපත්තිමය සංශෝධනයන් විෂයෙහි ප්‍රබල උත්තෝලකයන් බවට පත් වන නමුදු මෙකී අභියෝගාත්මක ප්‍රතිසංවිධානයන් සඳහා දේශපාලනමය අධිෂ්ඨානයක් ද දේශීය වශයෙන් අවශ්‍ය ය. ප්‍රතිසංවිධානයන් ක්‍රියාත්මක කරවීම සඳහා බැහැරින් පැනැවෙන අනුදේශයන් පමණක් ප්‍රමාණවත් නොවන බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඇති කරගත් එකඟතාවන් පිළිබඳව ශ්‍රී ලංකාව සතු අතීත අත්දැකීම් අනුව පෙනී යයි.

රාජ්‍ය-මහජන සහයෝගිතාවන් ප්‍රවර්ධනය කරවා රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රති ව්‍යුහගත කරවීම සඳහා ද මෙම ණය පහසුකම තුළින් අවස්ථාව සලසා ගත හැකි වන්නේය. ක්‍රමෝපායික ව්‍යවසාය කළමනාකරණ ආයතනය **(SEMA)** සහ මහජන උපයෝගිතා කොමසම **(PUC)** දැනටමත් මෙකී අවශ්‍යතාව සපුරාලීම පිණිස ක්‍රියාතිමක ය. බලයේ සිටින රජය සතු දේශපාලන ස්ථාවරත්වය අනුව බලන විට ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව වැනි අලාභ ලබමින් පවතින ආයතනයන් ප්‍රතිසංවිධානය සඳහා මේ ලැබී ඇත්තේ මෙතෙක් නොලද අවස්ථාවකි. අධ්‍යාශ ලිපියෙහි සඳහන් වන්නේ ද 2011 වන විට මෙම රාජ්‍ය ආයතන දෙක සමතුලිතතා ලක්ෂ්‍යය වෙත ගෙන ඒමට රජය අපේක්ෂා කරන බවයි.

දිගුකාලීන සාර්ව ආර්ථීක ස්ථාවරත්වය සඳහා අවශ්‍ය ප්‍රධාන සාධකය වන මූල්‍ය විනය විෂයෙහි වූ දැඩි කැප වීමක අවශ්‍යතාව රජය වටහාගෙන ඇති බවට ජාත්‍යන්තර ආයෝජකයන් තුළ විශ්වාසය යළි ගොඩනැංවීම සඳහා ද මෙම ණය පහසුකම උත්ප්‍රේරකයක් වන බව සඳහන් කළ යුතු වේ. මෙරට ආර්ථීකය විෂයෙහි මෙසේ ඇති වන විශ්වාසය ශ්‍රී ලංකාවෙහි ස්වෛරීත්වය ඉහළ තැනකට ගෙන ඒමට මෙන් ම ආයෝජකයන් තුළ උනන්දුව වැඩි කරවීමට ද හේතු වනු ඇත.

මූල්‍ය විනය ඉහළ නැංවීමේ අවශ්‍යතාව තුළින් කාර්ය ද්වීතීයයනය වීමත් එමගින් මධ්‍යම ආණ්ඩුව තුළ මෙන් ම මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාදේශීය පාලනාධිකාරීන් අතර සිදු වන්නා වූ අමතර වියදම් විශ්ලේෂණය කොට දැකගැනීම සඳහා ද පසුබිම සැකැසෙන්නේ ය. රජයේ වියදම් කපාහැරීම මුදල් ශේෂයන් යහපත් තත්ත්වයට පත් කරවීමෙහි ලා වැඩදායක පියවරක් වන අතර ම ආදායම් ලැබෙන මාර්ග පිළිබඳව ද විමසිලිමත් විය යුතු බව විශේෂයෙන් ම 2009 මුල් භාගයේ දී දක්නට ලැබුණු ආදායම් පහත වැටීමේ ප්‍රවනතාව දෙස සැලකිල්ල යොමු කිරීමේ දී පෙනේ. මේ අනුව ආයෝජන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද දිරි දීමනා ක්‍රමය වැනි පියවරයන් ද යළි සැලකිල්ලට භාජන කරමින් අධිවියදම් සහිත මූල්‍ය දිරිදීමනාවන් අවම කර ලීමට පියවර ගත යුතුව තිබේ. මෙතෙක් නොසලකා හරිනු ලැබ තුබුණු අවිධිමත් ආර්ථීක ක්‍රියාකාරීන් බදු අංශයන් ද ඇතුළත් වන පරිදි බදු අය කිරීමේ පිළිවෙත පුළුල් කරමින් ආදායම් තත්ත්වය ඉහළ නංවාගත හැකි මාර්ගයන් සොයා බැලිම ද එමෙන් ම ආකලිත වටිනාකම් බදු **(VAT)** අය කිරීමේ ක්‍රමය සංශෝධනය කිරීම ද අවශ්‍ය වන්නේ ය.

වෙනත් ආධාර දෙන රටවල ද ණය දෙන රටවල ද ආයෝජනයන් ගෙන එන රටවල ද විශ්වාසය ඉහළ යාම හේතු කොටගෙන පෙර සූදානම් පහසුකමකින් තොරව ශ්‍රී ලංකාව වෙතට විවෘත වෙතැයි සිතිය නොහැකි තවත් දොර කවුළු කීපයක් විවෘත කරවාගැනීමේ හැකියාව ද මෙම පෙර සූදානම් පහසුකම හේතු කොටගෙන උදා වෙතැයි විශ්වාස කළ හැකි ය. උතුරු නැගෙනහිර පමණක් නොව රටෙහි සෙසු පළාත්වල ද අත්‍යවශ්‍ය යටිතලයන් හි සාර්ථකව ආයෝජනය කිරීමේ හැකියාව රජයට තිබේ නම් ශ්‍රී ලංකාවෙහි දිගුකාලීන නිෂ්පාදන විභවතාවෙහි ඉහළ යාමක් නිරනුමානව ම ඇති වන්නේ ය. කෙටි කාලීන වශයෙන්, ගැටුම් පැවැති ප්‍රදේශවල ප්‍රතිසංස්කරණයන් හා සංවර්ධවයන් ක්‍රියාත්මක වන විට ලෝක ආර්ථීකයෙහි පහත වැටීමක් පවතිද්දී වුව ද දේශීය නිෂ්පාදනයන් පුළුල් කරවීම තුළින් වර්ධන අපේක්ෂාවන් ඉහළ නංවාගැනීමට හැකි වන පරිදි දේශීය ඉල්ලුමෙහි ඉහළ යාමක් ඇති වනු ඇත. පෙර සූදානම් පහසුකම මුළුමනින් නිසි පරිදි ප්‍රයෝජනයට ගැනුණහොත් විදේශ සංචිතයන්හි අනවරත ඉහළ යාම ද අයවැය පරතරය ක්‍රමයෙන් අඩු වී යාම ද මුදල් තත්ත්වයෙහි අඛණ්ඩ වර්ධනය ද අපේක්ෂා කළ හැකි වන්නේ ය.

### අභියෝග

අලුත් ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් ණය පහසුකම හා අදාළව අප මුහුණ දෙන එක් ප්‍රධාන අභියෝගයක් ලෙස සැලැකෙන්නේ මූල්‍ය ඉලක්කයන් සපුරාගැනීමයි. එනම් දැනට (2008) දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7 ක් ලෙස පවතින අයවැය පරතරය 2010 වන විට සියයට 6 දක්වාත් 2011 වනවිට සියයට 5 දක්වාත් පහත හෙළීමයි.

යෝධ සංවර්ධන සහ යළි පදිංචි කරවීමේ වැඩසටහන් ද සුවිශාල ආරක්ෂක විධිවිධානයන් ද ඉහළ නැංවෙන පොහොර සහනාධාරයන් ද දෙස බලන විට මෙම ඉල්ක්කයන් සපුරාගැනීම වූ කලී බරපතල ගැටලුවක් බව කිව යුතු ය. ආරක්ෂක අයවැයෙහි ප්‍රාග්ධන වියදම් පහත බැස ඇතැයි කිව හැකි නමුදු ප්‍රවර්තන වියදම් මේ ආකාරයෙන් ම පවතිනු ඇතැයි හෝ තවත් ඉහළ යනු ඇයි සිතිය හැකි ය. එකී ඉලක්කය සඳහා වූ වැඩපිළිවෙළක් මූල්‍ය කළමනාකරණ වගකීම් පනත නමින් 2003 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. කෙසේ වුව ද 2004 දී සුනාමි ව්‍යසනය හේතු කොටගෙන බොහෝ දුරට එයින් බැහැර වන්නට සිදු වූ අතර ප්‍රවර්තන වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන්නේ එතැන් සිට ය.

ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව ප්‍රතිව්‍යුහගත කරමින් ඒවා සමතුලිත ලක්ෂ්‍යය කරා ගෙන ඒම තවත් අභියෝගයකි. මෙම අරමුණ සපුරාගන්නේ කෙසේ ද යන්නත් ඒ සඳහා කෙතරම් කාලයක් ගත වේ ද යන්නත් පිළිබඳ ගැටලු පවතී. මෙයට අමතරව ශ්‍රී ලංකන් ගුවන් සේවය, ශ්‍රී ලංකා දුම්රිය සෙවය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය වැනි තවත් අලාභ ලබන බොහෝ රාජ්‍ය ආයතන තිබෙන බව ද කිව යුතු ය.

බදු ක්‍රමය සරල කරවීම ද බදු අය කරගැනීමේ වැඩ පිළිවෙළ ශක්තිමත් කරවීම ද බදු විගණන ක්‍රම වැඩි දියුණු කරවීම ද යනු අවධානයට යොමු විය යුතු තවත් වැදගත් විෂයයන් වේ. සියයට 3 ක ජාතිය ගොඩ නැංවීමේ බද්දක් හඳුන්වා දෙමින් ආදායම් වැඩි කරගැනීමේ කෙටි කාලීන වැඩ පිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබ තිබේ. දියුණු වෙමින් පවත්නා වෙනත් රටවල ඇත්තේ බදු වර්ග 7 සිට 9 දක්වා වූ ප්‍රමාණයකි. එහෙත් බදු වර්ග 25 කට ආසන්න ප්‍රමාණයක් මෙරට තුළ ක්‍රියාත්මකව පවතින බැවින් බදු ක්‍රමය ද විධිමත් සංශෝධනයකට භාජන කරවීම විෂයෙහි අවධානය යොමු විය යුතු වන්නේ ය. බදු ආදායම ඉහළ නංවාගැනීම කෙසේ වුව ද තව තවත් නව බදු පැනවීමෙහි ප්‍රතිඵලය වන්නේ පෞද්ගලික අංශයේ ආයෝජනයන් අධෛර්යමත් වී යාමයි. මෙහි දී ඉදිරිපත් වන අභියෝගය වන්නේ තව දුරටත් සංකීර්ණතා ඇති නොකොට පෞද්ගලික අංශයේ ආයෝජනයන් ධෛර්යමත් වන ආකාරයෙන් බදු ක්‍රමය විධිමත් කළ හැක්කේ කෙසේ ද යන ප්‍රශ්නයට පිළිතුරු සොයාගැනීමයි. මෑතක දී පත් කරන ලද බදු අය කිරීම පිළිබඳ ජනාධිපති කොමිසම මෙම අභියෝගයට මුහුණ දෙමින් සිටී.

කෙටිකාලීන විදේශීය ප්‍රාග්ධනය ගලා ඒමේ ප්‍රමාණය ද ඍජු ආයෝජනයන් ද එසේ ම ප්‍රති සංස්කරණ ව්‍යාපෘතීන් සඳහා ලැබෙන ආධාර අරමුදල් ද මෙකල වැඩි වී ඇති ආකාරය යටතේ විනිමය අනුපාතයන් කළමනාකරණය අසීරු කාර්යයක් බවට පත් වී තිබේ. මුදලෙහි අගය වැඩි වීමේ වේගය පාලනය කිරීම තුළින් අපනයනයන් සඳහා වූ තරගකාරිත්වය පවත්වාගෙන යාම පිණිස ද පියවර ගැනීමට ශ්‍රී ලංකාවට සිදු වන්නේ ය. නම්‍යශීලී විනිමය අනුපාතයක් පවත්වාගෙන යාම රටෙහි අවශ්‍යතාව වුව ද විශාල වශයෙන් විදේශීය මුදල් රට තුළට ගලා ඒමේ තත්ත්වයක් යටතේ අපනයන තරගකාරිත්වය ආරක්ෂා වන ආකාරයේ විනිමය අනුපාතයක් පවත්වාගෙන යාම අප ඉදිරියෙහි ඇති අභියෝගයකි.

ඉදිරියෙහි එන ජනාධිපති හා පාර්ලිමේන්තු මැතිවරණයන් ජාතික වියදම් විෂයෙහි කෙසේ බලපානු ඇත් ද යන්න හා සාධාරණ ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියා පිළිවෙතක් පවත්වාගෙන යා හැකි වේ ද යන්න මෙහි ලා මුහුණ දීමට සිදු වන තවත් අභියෝගයන් වේ. මැතිවරණ කාල සීමාවක් තුළ දී වියදම් පිළිබඳ විනය පවත්වාගෙන යාම අතිශයින් වැදගත් වන්නක් වන නමුදු ජනප්‍රිය ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ ඉඩකඩ පවතින හෙයින් එසේ වුවහොත් තව තවත් මූල්‍ය අස්ථාවරත්වයන් නිර්මාණය වනු ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් ණය පහසුකමෙහි ඉතිරි කොටස මුදා නොහැරීමට තීරණය කිරීමක් හේතුවෙන් බරපතල පසුබෑමකට මුහුණ දිමට අප ආර්ථිකයට සිදු වුවහොත් හැර, සිය ආර්ථික අරමුණු සපුරාගැනීමේ හැකියාව නිසැකව ම ශ්‍රී ලංකාව සතුව තිබේ. ණය මුදලෙහි ප්‍රථම කොටස එ.ජ. ඩොලර් මිලියන 322 ක් පමණකි. අතිශයින් වැදගත් වන්නේ මුදා හැරීමට තිබෙන එ.ජ. ඩොලර් බිලියන 2.2 යි. කිසියම් වූ හේතුවක් නිසා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් එකී කොටස මුදා නොහැරීමට තීරණය කරනු ලැබුවහොත් මෙරටෙහි ණය යෝග්‍යතාව බරපතල ලෙස පහත වැටෙන අතර බෙහෙවින් ඉහළ පොලී අනුපාතයන් යටතේ වුව ද වාණිජ ණයක් ලබාගැනීම එවිට අතිශය දුෂ්කර කාර්යයක් බවට පත් වනු ඇත. එබැවින් කෙතරම් මහජන අප්‍රසාදයන් හා දුෂ්කරතාවන් මධ්‍යයේ ද ණය පහසුමෙහි අරමුණු කෙරෙන් බැහැර නොවී සිටීමට අධිෂ්ඨාන කර ගත යුතු වන්නේ ය.

## ප්‍රතිපත්ති නිර්දේශයන්

- වගකිවයුතු බවක් හා ආර්ථික යහ පාලනයක් ද මූල්‍ය විනයක් ද යළි ඇති කරවීම අවශ්‍ය ය. පශ්චාත් විගණනයකට යටත්ව ණය ආපසු ගෙවීමේ ශක්තිය තහවුරු කිරීමට ද හැකි විය යුතු ය.

- සමස්ත පෞද්ගලික අංශයෙන් සියයට 40 ක් පමණක් වන විධිමත් පෞද්ගලික/ආතනික අංශය මත ම යැපීමකින් තොරව බදු ප්‍රතිපත්තීන් සහේතුක ලෙස පුළුල් කරමින් අවිධිමත් පෞද්ගලික අංශයෙන් ද බහුතරයක් සහභාගි කරවාගැනීමට පියවර ගැනීම අවශ්‍ය ය. බදු නීතීන් මෙන් ම බදු ක්‍රියාත්මක කරවන්නන් ද විසින් විවිධ අංශයන් හි පැතිරී සිටින පුද්ගලයන් වෙතින් තවත් බදු අය කරගැනීමට පියවර ගත යුතු ය. රුපියල් මිලියන 5 ඉක්මවන විශාල මිල දී ගැනීම් සඳහා බදු ලිපි ගොනු අංකය පූර්ව අවශ්‍යතාවක් බවට පත් කළ යුතු ය. දේශපාලකයන් ද රාජ්‍ය අංශයේ සේවකයන් ද බදු ගෙවන්නන් බවට පත් කරවමින් ආදර්ශයක් සැපයිය යුතු ය.

- රාජ්‍ය ව්‍යවසායයන් හි දී රාජ්‍ය-මහජන සහයෝගිතාවත් යටිතල පහසුකම් සඳහා කැරෙන ආයෝජනයනුත් විෂයෙහි ප්‍රමුඛත්වය ලබා දිය යුතු ය. එබඳු ප්‍රතිපත්තීන් තුළින් රාජ්‍ය වියදම් පහත හෙළමින් පොදු අරමුදල් වෙනත් අවශ්‍යතාවන් සඳහා යෙදවීමේ හැකියාව ලැබෙනු ඇත. මේ අනුව බලන කල රාජ්‍ය ව්‍යවසායයන් හි අයිතිය පෞද්ගලික අංශය වෙත පවරනවාට වඩා ඒවායෙහි කළමනාකරණය පමණක් පෞද්ගලික අංශය වෙත පැවරීම ඵලදායක වන්නේ ය.

- පාරදෘශ්‍ය භාවයෙන් යුතු ලංසු ක්‍රමයක් ඔස්සේ ආයෝජනයන් ආකර්ෂණය කරවාගත යුතු ය.

- සමෘද්ධි වැනි ශුභසාධක/සුරක්ෂිතතා වැඩසටහන් යටතේ සහනාධාර ලබා දීමේ දී සාවද්‍ය ලෙස අර්ථලාභීන් තෝරාගැනීමේ අවස්ථාවන් පිළිබඳව යළි සොයා බලා රාජ්‍ය වියදම් පහත හෙළීමටත් එබඳු වැඩසටහන් තුළින් අපේක්ෂිත ආර්ථික හා සමාජ ශුභසාධනයන් ඉහළ නංවාලීමටත් පියවර ගත යුතු ය.

- ව්‍යාපාර සඳහා වූ පරිසරමය සුමට භාවය ද ලෝක තරගකාරිත්වය ද බදු පිළිවෙත ද අතින් ශ්‍රී ලංකාවට අත් වන ස්ථානය ඉහළ තැනකට ගෙන ඒම තුළින් වඩ වඩා ඍජු විදේශීය ආයෝජනයන් ආකර්ෂණය කරගත හැකි වන්නේ ය. යටිතල පහසුකම් විෂයෙහි රජයේ මුදල් වැඩිපුර යෙදවීමකින් තොරව වුව ද, කාර්යයන් සරල කරවීමත් නිලධරවාදය බැහැර කරවීමත් දූෂණයන්ට එරෙහි නිසි පියවර ගැනීමත් පිළිබඳ අපේක්ෂිත ඉලක්කයන් වෙත ළඟා විය හැකි වේ.

- දේශපාලන බලය බෙදාහැරීම සම්බන්ධයෙන් වඩා ඉදිරියට ගොස් ඇති බවක් පෙනෙන්නට නොතිබුණ ද මෙරට තුළ ආයෝජනය කිරීම සඳහා අරමුදල් ලැබෙන බවට විශ්වාසයක් විදේශයන් හි වෙසෙන ශ්‍රී ලාංකිකයන් තුළ ඇති වන පරිදි පොලී අනුපාතයන් අඩු කිරීමේ (තනි සංඛ්‍යාංකයකට) වැඩ පිළිවෙළක් වෙතට ශ්‍රී ලංකාව යොමු වීම අවශ්‍ය ය.

- නිෂ්පාදනය ඉහළ යාමෙහි ද සේවා අංශය ප්‍රසාරණය වීමෙහි ද ඉහළ විභවතාවන් සහිත ප්‍රදේශයන් තුළට පෞද්ගලික අංශයේ ආයෝජනයන් ආකර්ෂණය කරවාගැනීම අරභයා ප්‍රධාන වශයෙන් ම මහා මාර්ග හා ගුවන් ප්‍රවාහනයන් හි ලා උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධයේ බලපෑමට හසුව තුබුණු ප්‍රදේශයන් හි සුරක්ෂිතතාවත් යටිතල පහසුකම් සංවර්ධනයත් පිළිබඳ පැහැදිලි තොරතුරු ප්‍රකාශයට පත් කරරනු ලැබිය යුතු ය. ව්‍යාපාරික ප්‍රජාව තුළ පවත්නා මානසික අවිනිශ්චිතතාවන් පහව යාමට එය හේතු වනු ඇත.

ස්වාධීන ලාභ අරමුණු කොට නොගත්, පර්යේෂණ සහ උපදේශන ආයතනයක් වන "පාත්ෆයින්ඩර් පදනම" විසින් පසුගියදා පවත්වනු ලද 17 වන සංවාද වැඩසටහනෙහි සාකච්ඡාවට බඳුන් වූයේ ශ්‍රී ලංකා රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් ලද ණය පහසුකම තුලින් මතු වන අභියෝග සහ අවස්ථා පිලිබඳවයි. මෙම සාකච්ඡාවට දායක වූ ප්‍රවීන විද්වත් මඬුල්ල විසින් විවිධ දෘෂ්ඨි කෝණයන් යටතේ සිය ඉදිරිපත් කිරීම් සිදු කළහ. ආචාර්ය සමන් කැලේගම "ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - අභියෝග, අවස්ථා සහ ශ්‍රී ලංකාව සඳහා ප්‍රතිපත්තිමය විකල්පයන්", ආචාර්ය අනුර ඒකනායක විසින් "පෞද්ගලික අංශයේ දෘෂ්ඨි කෝණයන්" ලෙසින් ද, ආචාර්ය පී. උස්වත්තආරච්චි විසින් "මෙම ආන්දෝලනය කුමක් සඳහා ද ?" යටතේ දේශන ඉදිරිපත් කළහ.

මෙහි ලා නිර්දේශ කර ඇති බදු ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම සහ බදු පදනම පුළුල් කිරීම, ව්‍යාපාර පවත්වාගෙන යාමේ වාතාවරණය වැඩි දියුණු කිරීම, ලෝක තරඟකාරිත්වය තුළ ශ්‍රී ලංකාව ඉදිරියට ගෙන ඒම සහ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී නිවැරැදිව අර්ථලාභීන් හඳුනා ගැනීම වැනි නිර්දේශයන් සමඟ පාත්ෆයින්ඩර් පදනමෙහි අපද එකඟ වන්නෙමු. තවද, මෙම ප්‍රතිපත්ති නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම මගින් සාර්ව ආර්ථික ස්ථායිතාවයක් සහ සුනිත්‍යය ආර්ථික සංවර්ධනයක් ලබා ගත හැකි බව විශ්වාස කරන්නෙමු.

**'ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් ණය පහසුකම - අභියෝගයන් සහ වාසිදායක අවස්ථා' යන මැයෙන් පැවැති 'සංවාද' වැඩසටහන පදනම් කරගනිමින් මෙම ප්‍රතිපත්ති සන්නිවේශනය සකස් කරන ලදී. ප්‍රධාන වශයෙන් ආචාර්ය සමන් කැලේගම, ආචාර්ය අනුර ඒකනායක, ආචාර්ය පී. උස්වත්තආරච්චි සහ මහාචාර්ය ඩබ්ලපු. ඩී. ලක්ෂ්මන් යන මහත්වරු මෙම වැඩසටහනෙහි දී අදහස් දැක්වූහ.**

**දර්ශනී ප්‍රේමරත්න මෙනෙවිය, පර්යේෂණ සහායිකා - ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් සම්පාදනය කරන ලදී.**

'POLICY BRIEF 17'

"පාත්ෆයින්ඩර්" පදනම | දුරකථන අංකය: 2596281 | ෆැක්ස් අංකය: 2595894 | ඊමේල්: info@pathfinderfoundation.org
වෙබ් අඩවිය: www.sanvada.org, www.pathfinderfoundation.org

සංස්කරණ සහාය: අමීරා අරූස් මිය, ව්‍යාපෘති කළමනාකාරිණිය.